## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම (**Recovery Plan for Learning Loss - 2022**)

- 7 ශ්‍රේණිය

(7 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 49ක් ඇත)

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝප දේශයේ ක්‍රියාකාර කම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| **7 ශ්‍රේණිය පළමු වන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | | |
| 1.0 ජෛව පද්ධතිවල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ජීවය හා ජෛව ක්‍රියාවලි අන්වේෂණය කරයි | 1.1 සපුෂ්ප ශාකවල රූපීය ලක්ෂණ ගවේෂණය කරයි<br>1.2 සපුෂ්ප ශාකවල මූලිකාංගවල විවිධත්වය ගවේෂණය කරය | සපුෂ්ප හා අපුෂ්ප ශාක සඳහා උදාහරණ ලියයි<br>බීජ, ඵල, කඳ, මුල් සහ පත්‍රවල විවිධත්වය විස්තර කරයි<br>පුෂ්පයක ප්‍රධාන කොටස්වල කාර්යයන් සඳහන් කරයි<br>ද්විබීජපත්‍රී සහ ඒකබීජපත්‍රී ශාකවල බාහිර ලක්ෂණ නිරීක්ෂණය කර ඒවායේ ප්‍රධාන කොටස් හඳුනා ගනියි<br>නිදර්ශක භාවිත කරමින් ඒකබීජ හා ද්විබීජපත්‍රී ශාකවල වෙනස්කම් හඳුනා ගනිය<br>බීජ එකතුවක් පිළියෙල කරයි<br>විවිධ බීජ, ඵල, කඳ, මුල් හා පත්‍රවල රූප සටහන් අඳියි<br>ද්විබීජ පත්‍රී පුෂ්පයක් ඇඳ කොටස් නම් කරයි<br>ජෛව විවිධත්වය අගය කරයි. | • සපුෂ්ප ශාකවල රූපීය ලක්ෂණ<br>• බීජ, ඵල, කඳ, මුල් හා පත්‍රවල විවිධ ආකාර<br>• ද්විබීජපත්‍රී පුෂ්පයක කොටස් | පිටු අංක 2-3 | 01 ශාක විවිධ ත්වය | 08 |
| 3.0- කාර්යක්ෂමතාව හා ඵලදායිතාව ප්‍රශස්ත මට්ටමෙන් | 3.1ස්ථිති විද්‍යුතය හා සබැඳි සංකල්ප වර්ධනය කර ගනියි. | ස්ථිති විද්‍යුත් ආරෝපණ පිළිබඳ ඓතිහාසික පසුබිම කෙටියෙන් සඳහන් කරයි<br>පොදු සම්මත භාවිත කරමින් වස්තුවක් ධන හා ඍණ ලෙස | • ස්ථිති විද්‍යුතය<br>• වස්තුවක් ආරෝපණය කිරීම<br>• ආකර්ෂණය හා | පිටු අංක 12-13 | 2.0 - ස්ථිති විද්‍යුතය | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝප දේශයේ ක්‍රියාකාර කම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| පවත්වා ගනිමින් විවිධ ශක්ති පදාර්ථ සමඟ දක්වන අන්තර්ක්‍රියා සහ ශක්ති පරිවර්තන භාවිත කරයි. | 3.2 ස්ථිති විද්‍යුතයේ මූලික සංකල්පවල ප්‍රායෝගික භාවිත ආදර්ශනය කරයි | ආරෝපණය කරන ආකාරය විස්තර කරයි | විකර්ෂණය<br>• ස්ථිති විද්‍යුත් ආරෝපණ<br>• ධන ආරෝපණ<br>• ඍණ ආරෝපණ<br>• ධාරිත්‍රක<br>• ආරෝපණය හා විසර්ජනය | | | |
| | | ධන හා ඍණ ලෙස විද්‍යුත් ආරෝපණ වර්ග දෙකක් ඇති බව පවසයි | | | | |
| | | විද්‍යුත් ආරෝපණ තාවකාලික ව ගබඩාකර තබාගත හැකි උපකරණයක් ලෙස ධාරිත්‍රකය සඳහන් කරයි | | | | |
| | | ඇතිල්ලීමේ ක්‍රමය භාවිත කරමින් වස්තුවක් ආරෝපණය කරයි | | | | |
| | | අකර්ෂණය හා විකර්ෂණය උපයෝගි කර ගනිමින් විද්‍යුත් ආරෝපණ වර්ග දෙකක් ඇති බව පෙන්වීම සඳහා ක්‍රියාකාරකම් සැලසුම්කර ක්‍රියාත්මක කරයි | | | | |
| | | ධාරිත්‍රකයක ආරෝපණ හා විසර්ජන ගුණ ආදර්ශනය කිරීම සඳහා ක්‍රියාකාරකම් සිදු කරයි | | | | |
| | 3.3. විද්‍යුත් චුම්භක ප්‍රේරණය ආදර්ශනය කරයි<br>3.4 විදුලිය ජනනය කිරීමට අදාළ සරල ක්‍රියාකාරකම් සිදු කරයි | විවිධ රසායනික කෝෂ ලේඛනගත කරයි | • විද්‍යුත් ප්‍රභව<br>• රසායනික කෝෂ<br>• ඩයිනමෝව<br>• සූර්ය කෝෂ<br>• AC සහ DC | පිටු අංක 14-15 | 3.0- විදුලි ජනනය | 08 |
| | | විද්‍යුත් ප්‍රභවයක් ලෙස සූර්ය කෝෂය හඳුනා ගනියි | | | | |
| | | විද්‍යුත් ධාරාව සරල ධාරාව (AC) සහ ප්‍රත්‍යාවර්ත ධාරාව (DC) ලෙස පවතින බව ප්‍රකාශ කරයි | | | | |
| | | විදුලිය ජනනය කිරීම සඳහා සරල කෝෂය නිර්මාණය කරයි | | | | |
| | | සරල ඩයිනමෝවක් නිර්මාණය කරයි | | | | |
| | | සූර්ය කෝෂ භාවිත කරමින් සරල ක්‍රියාකාරකම් සිදු කරයි. | | | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝප දේශයේ ක්‍රියාකාර කම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | AC- DC ජෙනරේටරය හෝ සුදුසු උපකරණ භාවිත කරමින් AC හා DC ආදර්ශනය කරයි | | | | |
| | | විද්‍යුත් ප්‍රභව නිර්මාණශීලී ව භාවිත කළ යුතු බව පිළිගනියි | | | | |
| 2.0 ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් යුතු ව පදාර්ථය, පදාර්ථයේ ගුණ හා ඒවායේ අන්තර්ක්‍රියා ගවේෂණය කරයි | 2.2 නිවස ආශ්‍රිත විවිධ ද්‍රව්‍ය අම්ල හා භස්ම ලෙස වර්ග කරයි | අම්ල හා භස්ම වෙන්කර හඳුනා ගැනීමට භාවික කළ හැකි ද්‍රව්‍ය ඇති බව ප්‍රකාශ කරයි | • අම්ල සහ භස්ම<br>• දර්ශක භාවිත කර අම්ල හා භස්ම හඳුනා ගැනීම<br>• නිවසේ හා පාසල් විද්‍යාගාරයේ ඇති අම්ල හා භස්ම | පිටු අංක 11-12 | 05- අම්ල භස්ම | 07 |
| | | නිවසේ හා පාසලේ ඇති අම්ල හා භස්ම ලේඛනගත කරයි | | | | |
| | | ආම්ලික හෝ භාස්මික ගුණ නොපෙන්වන උදාසීන ගුණ දක්වන ද්‍රව්‍ය ඇති බව ප්‍රකාශ කරයි | | | | |
| | | සමහර ශාක නිස්සාරක එකතු කර ඇකි විට දී විවිධ ද්‍රාවණවල සිදු වන වර්ණ විපර්යාස නිරීක්ෂණය කරයි | | | | |
| | | ලිට්මස් හා pH කඩදාසි භාවිත කරමින් දී ඇති ද්‍රාවණ අම්ල හා භස්ම ලෙස වර්ග කරයි. | | | | |
| | | විවිධ ද්‍රව්‍ය ආම්ලික භාස්මික හා උදාසීන යන්න පදනම් කර ගනිමින් වර්ග කළ හැකි බව පිළිගනියි. | | | | |
| 1.0 ජෛව පද්ධතිවල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා හා ජෛව ක්‍රියාවලි අන්වේෂණය කරයි | 1.4 ජීවීන්ගේ පරිසර අනුවර්තන ගවේෂණය කරය | උදාහරණ දක්වමින් ජීවීන් පරිසරයට දක්වන අනුවර්තන විස්තර කරයි | • සතුන්<br>• විවිධ පරිසරවලට දක්වන අනුවර්තන හැඩය වර්ණය | පිටු අංක 04 | 06- සත්ත්ව විවිධත්වය | 05 |
| | | ජීවීන්ට පරිසරයේ පැවතීම සඳහා හැඩය හා වර්ණය දායක වන්නේ කෙසේ ද යි පරීක්ෂණාත්මක ව ආදර්ශනය කරයි | | | | |
| | | ජෛව විවිධත්වය අගය කරය | | | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝප දේශයේ ක්‍රියාකාර කම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | 1.5 ජීවීන් කාණ්ඩගත කිරීම සඳහා දෙබෙදුම් සුචි භාවිත කරයි | ජීවීන් කාණ්ඩ ගත කිරීම සඳහා දෙබෙදුම් සුචි භාවිත කළ හැකි බව ප්‍රකාශ කරයි.<br>ශාක හා සතුන් කාණ්ඩ ගත කිරීම සඳහා දෙබෙදුම් සුචි භාවිත කරයි. | • වර්ගීකරණය<br>• දෙබෙදුම් සුචි | පිටු අංක 05 | 06- සත්ත්ව විවිධත්වය | 03 |
| | | | | | සමස්ත එකතුව | 39 |